රුහුණ විශ්වවිද්‍යාලය

2015/2016 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය/විශේෂ) උපාධි - 2000 ස්ථලය
දෙවන සමාසික පරීක්ෂණය - 2017 මාර්තු

**PAL 2201** – සාම්ප්‍රදායික හා විග්‍රාහාත්මක පාලි ව්‍යාකරණය

පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

කාලය : පැය 03

---

01. (අ) පහත දැක්වෙන සංස්කෘත පද පාලියට පරිණාමය වන අයුරු දක්වන්න.

i. ඖරස
ii. භාර්යා
iii. කෘෂ්ණ
iv. වර්ෂ
v. ආෂාඪ

(ලකුණු 05)

(ආ) පහත දැක්වෙන පාලි පද පරිණාමය වූයේ කුමන පදයකින් දැයි දක්වා පරිණාමය වූ අයුරු පහදන්න.

i. එළක
ii. සින්ධව
iii. පත්ත
iv. කෂ්ට
v. වෙණ්හු

(ලකුණු 05.)

(ඉ) පහත දැක්වෙන පදයන්හි ව්‍යාකරණ විභාග දක්වන්න.

i. දද්දල්ලති
ii. ධම්මධරො
iii. කාතබ්බං
iv. භොජ්ජ
v. ගය්හං
vi. වෙනයික
vii. මානව
viii. ජනපපදො
ix. කෙසාකෙසී
x. සොතබ්බ

(ලකුණු 10 )

99

02. සංස්කෘත ඒකල ව්‍යඤ්ජන පාලියට පරිණාමය වීමේදී සංඛ්‍යාත්මකව හා හැසිරීම මත සිදුවූ වෙනස්කම් පෙන්වා දෙන්න.

03. මූලාක්ෂර වින්‍යාසය සහ ස්වර භක්තිය මගින් සංස්කෘත ව්‍යඤ්ජන සංයුක්ත පාලියට පරිණාමය වන අයුරු පහදන්න.

04. පාලි මාත්‍රානීතිය පැහැදිලි කොට එය භාෂා පරිණාමයේ දී උපයෝගී වන අයුරු පෙන්වා දෙන්න.

05. කාරක හඳුන්වා සම්ප්‍රදාන කාරකය උදාහරණ සහිතව විස්තර කරන්න.

06. රූපසිද්ධියේ හා පයෝගසිද්ධියේ ඇතුළත් පුල්ලිංග ශබ්ද සාධනයට අදාළ නීතිවල විශේෂතා ප්‍රකට කරන්න.

07. කිතක විග්‍රහය පිළිබඳ රූපසිද්ධි හා පයෝගසිද්ධි ග්‍රන්ථද්වයේ වෙනස්කම් සාකච්ඡා කරන්න.

08. සාමඤ්ඤ තද්ධිතය උදාහරණ සහිතව විග්‍රහ කරන්න.

(එක් පිළිතුරකට ලකුණු 20 බැගිනි.)

@@@@@@@